වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2024

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

වැය ශීර්ෂ අංකය 010

අන්තර්ගතය

පළමුවන පරිච්ඡේදය ---------- 1

1 ආයතනික පැතිකඩ හා ක්‍රියාවට නැංවීමේ සාරාංශය 2

1.1. හැඳින්වීම 2

1.2. ආයතනයේ දැක්ම හා මෙහෙවර 2

1.3. කොමිෂන් සභාවේ කාර්යභාරය 2

1.4. කොමිෂන් සභාවේ සංයුතිය 3

1.5. 2024 ජනවාරි මස 01 වන දිනට පෙර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව 4

1.6. කොමිෂන් සභාවේ ව්‍යුහය 4

දෙවන පරිච්ඡේදය ---------- 5

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම 6

2.1. ආයතනයේ ප්‍රගතිය 6

2.1.1. පැමිණිලි යොමුවීම 6

2.1.2. විමර්ශන කටයුතු සහ වැටලීම් 8

2.1.3. නෛතික කටයුතු 11

2.1.4. නිවාරණය 18

2.1.5. වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම 21

2.2. අභියෝග 22

2.3. ඉදිරි ඉලක්ක 22

තෙවන පරිච්ඡේදය ---------- 23

3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 24

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 24

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 25

3.3. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 26

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් (i) – (viii) 27

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 36

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය 37

මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම

3.7. දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 38

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 39

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 40

සිව්වන පරිච්ඡේදය ---------- 48

4 කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 49

පස්වන පරිච්ඡේදය ---------- 50

5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 51

5.1. හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු 51

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 52

හයවන පරිච්ඡේදය ---------- 54

6 මානව සම්පත් පැතිකඩ 55

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 55

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය 55

6.3. මානව සම්පත් සංවර්ධනය 56

හත්වන පරිච්ඡේදය ---------- 61

7 අනුකූලතා වාර්තා 62

පළමුවන පරිච්ඡේදය

1. ආයතනික පැතිකඩ හා ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1.2. ආයතනයේ දැක්ම හා මෙහෙවර

1.3. කොමිෂන් සභාවේ කාර්යභාරය

1.4. කොමිෂන් සභාවේ සංයුතිය

1.5. 2024 ජනවාරි මස 01 වන දිනට පෙර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

1.6. කොමිෂන් සභාවේ ව්‍යූහය

1. ආයතනික පැතිකඩ හා ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ විධි විධාන අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවනු ලැබ ඇති අතර, පනතේ 3(2) උප වගන්තිය අනුව මෙය අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වන බව දක්වා ඇත. එමෙන්ම කොමිෂන් සභාවට පනත මගින් පැවරී ඇති බලතල හෝ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී නීතිය යටතේ හිමිකම් ලැබූ අධිකරණයක් හෝ විනිශ්චයාධිකරණයක් මගින් හැර වෙනත් කිසිදු මැදිහත්වීමකට යටත් නොවී ස්වාධීනව කටයුතු සිදුකළ යුතු බව 3(4) උප වගන්තිය මගින් දක්වා ඇත.

1.2. ආයතනයේ දැක්ම හා මෙහෙවර

දැක්ම

සුපිලිපන්නබව දිරි ගැන්වෙන සහ යුක්තිය තහවුරු කෙරෙන දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක්

මෙහෙවර

නීතිය සවිමත් ව බලාත්මක කිරීම, නිවාරණ යාන්ත්‍රණයන් හා විනිවිදබව සහිත පාලනයක් තුලින් දූෂණය තුරන් කිරීම සහ එමගින් සවිමත් ආර්ථිකයක් ඇති කිරීමට සහය වීම මෙන් ම සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා දේශයේ සම්පත් සුරැකීම.

1.3. කොමිෂන් සභාවේ කාර්යභාරය

1. 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් ලැබෙන ලැමිණිලි සඳහා සාධාරණ විමර්ශන සිදුකිරීම, ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය වන පැමිණිලි සඳහා නියමිත අධිකරණයන්හි නඩු පැවරීම සහ අධිකරණ වල එම නඩු මෙහෙයවීම.
2. වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ මධ්‍යම අධිකාරිය වශයෙන් ක්‍රියා කිරීම.
3. දූෂණය වැලැක්වීම සඳහා ශ්‍රී ලංකා විසින් එළඹ ඇති ජාත්‍යන්තර සම්මුති, ගිවිසුම් සහ බැඳීම් ක්‍රියාත්මක කිරීම.
4. දූෂිත ක්‍රියා පිළිබඳව මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම.
5. දූෂණ විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
6. දූෂණ ක්‍රියා අනාවරණය කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන වල නීති, පරිවයන් සහ කාර්ය පටිපාටි පරීක්ෂා කිරීම.
7. දූෂණය තුරන් කිරීම සඳහා රාජ්‍ය හෝ පුද්ගලික ආයතන වෙත මගපෙන්වීම සහ නියෝග ලබාදීම.

8. දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ රජය වෙත ඉදිරිපත් කිරීම.
9. කොමිෂන් සභාවේ නිලධාරීන් සහ සේවා නියුක්තයන්ගේ පත්වීම්, උසස් වීම් සහ විනය පාලනය සම්බන්ධ කටයුතු

1.4. කොමිෂන් සභාවේ සංයුතිය

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 4(1) උප වගන්තිය අනුව, නීතිය පිළිබඳ අවම වශයෙන් වසර 20 ක පළපුරුද්දක් සහිත ප්‍රවීණ හා විශිෂ්ඨත්වයට පත්වූ එක් තැනැත්තෙකු හා

I. අපරාධ විමර්ශනය කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම
II. වෝහාරික විගණනය
III. වෝහාරික ගිණුම්කරණය
IV. ඉංජිනේරු විද්‍යාව
V. ජාත්‍යන්තර සම්බන්ධතා සහ රාජ්‍ය තාන්ත්‍රික සේවා
VI. මහජන කටයුතු කළමනාකරණය
VII. රාජ්‍ය පරිපාලනය

යන සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් එකක් හෝ කිහිපයක් පිළිබඳ ප්‍රවීණ, විශිෂ්ටත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු 20 ක පළපුරුද්දක් සහිත තැනැත්තන් දෙදෙනෙකු ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාවේ සාමාජිකයින් ලෙස ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ.

ඒ අනුව,


- හිටපු අභියාචනාධිකරණ විනිසුරු හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය මහලේකම් විනිසුරු ඩබ්.එම්.එන්.පී. ඉද්දවල මහතා - සභාපති
- ජ්‍යෙෂ්ඨ බැංකු කරුවෙකු වන මහජන බැංකුවේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී නීතීඥ කේ.බර්නාඩ් රාජපක්ෂ මහතා - සාමාජික
- අතිරේක සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ චේතිය ගුණසේකර මහතා - සාමාජික

යන සාමාජිකයින් තිදෙනා 2024 ජනවාරි මස 01 වන දින සිට රාජකාරී ආරම්භ කරන ලදී.

1.5. 2024 ජනවාරි මස 01 වන දිනට පෙර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

1954 අංක 11 දරණ අල්ලස් පනත මගින් ස්ථාපනය කරන ලද අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුව අහෝසි කරමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව 1994 අංක 19 දරණ පනත යටතේ පිහිටවූ අතර එය 1994 දෙසැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක විය. 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත යටතේ අල්ලස හා දූෂණය මැඩලීම සම්බන්ධව කොමිෂන් සභාව තවදුරටත් බලාත්මක කරන ලද අතර, 2024 ජනවාරි මස 01 වන දින සිට නව සාමාජිකයින් යටතේ කොමිෂන් සභාව ක්‍රියාත්මක වේ.

1.6. කොමිෂන් සභාවේ ව්‍යුහය



දෙවන පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. ආයතනයේ ප්‍රගතිය

2.2. අභියෝග

2.3. ඉදිරි ඉලක්ක

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. ආයතනයේ ප්‍රගතිය

2.1.1. පැමිණිලි යොමුවීම

2.1.1.1. 2024 වර්ෂය තුළ ලද පැමිණිලි පිළිබඳ විස්තර

වර්ෂය ආරම්භයේ දී ඉතිරිව පැවැති පැමිණිලි	389
වර්ෂය තුළදී ලද පැමිණිලි සංඛ්‍යාව	4,267
පෙර පැමිණිලි හා සමාන බැවින් අදාළ ගොනුවලට යොමු කළ පැමිණිලි	(543)
මුළු පැමිණිලි සංඛ්‍යාව	4,113
පැමිණිලි කමිටුවට ඉදිරිපත් කළ පැමිණිලි සංඛ්‍යාව	(3,873)
වර්ෂය අවසානයේදී අත ඉතිරි පැමිණිලි සංඛ්‍යාව	240

2.1.1.2. පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කළ පැමිණිලි සඳහා ලද නියෝග

විමර්ශනය සඳහා නියෝග ලද පැමිණිලි සංඛ්‍යාව - 1,105

විමර්ශනය සඳහා නියෝග ලද පැමිණිලි			එකතුව
අල්ලස් පැමිණිලි	දූෂණ පැමිණිලි	අයුතු වත්කම් ඉපයීම පිළිබඳ පැමිණිලි	
439	566	100	1,105

විමර්ශනය නො කිරීම සඳහා නියෝග ලද පැමිණිලි සංඛ්‍යාව - 1,175

විස්තරය	පැමිණිලි සංඛ්‍යාව
ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර නොතිබීම සහ අල්ලස් පනතට අදාල නොවීම හේතුවෙන් තවදුරටත් කටයුතු නොකිරීමට තීරණය කරන ලද පැමිණිලි සංඛ්‍යාව	1,175
එකතුව	**1,175**

වෙනත් ආයතන වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව - 803


විස්තරය	පැමිණිලි සංඛ්‍යාව
කොමිෂන් සභා පනතට අදාල නොවූ බැවින්, ඉදිරි කටයුතු සඳහා වෙනත් ආයතන වෙත යොමුකළ පැමිණිලි සංඛ්‍යාව	803
එකතුව	**803**

වෙනත් ආයතන වලින් හා නීති අංශයෙන් වාර්තා කැඳවීමට නියෝග ලද පැමිණිලි සංඛ්‍යාව - 790


විස්තරය	පැමිණිලි සංඛ්‍යාව
වෙනත් ආයතන (අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු) වලින් වාර්තා කැඳවීමට කටයුතු කළ පැමිණිලි සංඛ්‍යාව	780
විමර්ශන ආරම්භ කිරීමට ඇති හැකියාව පිළිබඳව සලකා බැලීම සඳහා නීති වාර්තා කැඳවීමට තීරණය කළ පැමිණිලි සංඛ්‍යාව	10
එකතුව	**790**

වැටලීම් සඳහා ලද පැමිණිලි සංඛ්‍යාව - 116

2.1.1.3. 2024.12.31 දක්වා ලද පැමිණිලි පිළිබඳ තොරතුරු ප්‍රස්ථාරයක් ලෙස



පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කළ පැමිණිලි සඳහා ලද නියෝග වල සංයුතිය




2.1.1.4. 2014 වර්ෂයේ සිට 2024.12.31 දක්වා ලද පැමිණිලි පිළිබඳ තොරතුරු

වර්ෂය	ලද පැමිණිලි සංඛ්‍යාව	විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි සංඛ්‍යාව **
2014	2,345	863
2015	3,964	1,823
2016	3,450	2,435
2017	2,768	1,573
2018	3,465	2,086
2019	3,305	2,020
2020	2,764	1,909
2021	2,335	892
2022	2,512	921
2023	3,431	1,152
2024	4,267	1,105

** වැටලීම් සඳහා ලද පැමිණිලි හැර

2.1.1.5. 2014 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ලද පැමිණිලි සංඛ්‍යාව සහ විමර්ශනය කිරීමට තීරණය කල පැමිණිලි සංඛ්‍යාව ප්‍රස්ථාරයක් ලෙස



2.1.2. විමර්ශන කටයුතු සහ වැටලීම්

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත යටතේ දක්වා ඇති වැරදි සම්බන්ධ විමර්ශන කටයුතු කොමිෂන් සභාවේ විමර්ශන අංශය මගින් සිදුකරනු ලැබේ. පනතේ 42 වගන්තිය ප්‍රකාරව,

- යම් තොරතුරක් ලැබීමෙන් පසුව
- පැමිණිල්ලක් ලැබීමෙන් පසුව
- කොමිෂන් සභාවේ අවශ්‍යතාවය අනුව හෝ
- කොමිෂන් සභාව වෙත ලැබෙන වෙනත් යම් වැදගත් දෙයක් මත පදනම්ව

මූලික පරීක්ෂණයක් ආරම්භ කළ හැකි වේ. එහිදී පනතේ 41 වන වගන්තියේ සඳහන් වරදක් සිදුකර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වේ නම්, විමර්ශනයක් පැවැත්වීමට තීරණය කළ හැක. එසේ වුවද, 41 වන වගන්තියේ සඳහන් වරදක් සිදුකර ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම් මූලික පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව විමර්ශනයක් පැවැත්වීමට ද කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2.1.2.1. විමර්ශන කටයුතු

කොමිෂන් සභාව විසින් 2024 වර්ෂය තුළ ලැබුණු පැමිණිලි අතුරින් විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි 1,105 කට අදාළ ගොනු වල විමර්ශන කටයුතු විමර්ශන අංශය මගින් ආරම්භ කරන ලද අතර, මීට පෙර කාලසීමාවන්හි ලැබුණු ගොනු ද ඇතුළුව වර්ෂය අවසාන වන විට විමර්ශන ගොනු 2,361 කට අදාළ විමර්ශන කටයුතු සිදුකරමින් පවතී.

2024.12.31 දක්වා එක් එක් විමර්ශන අංශය විසින් අවසන් කළ ගොනු පිළිබඳ තොරතුරු

අනු අංකය	අංශය	ගොනු සංඛ්‍යාව
1	දූෂණ විමර්ශනය I	397
2	දූෂණ විමර්ශනය II	445
3	දූෂණ විමර්ශනය III	379
4	දූෂණ විමර්ශනය IV	397
5	වත්කම් විමර්ශන අංශය	378
6	විවෘත විමර්ශන අංශය	583
7	වැටලීම් I	53
8	වැටලීම් II	51
9	වැටලීම් III	47
10	වැටලීම් IV	61
11	රහසිගත බුද්ධි විමර්ශන අංශය	113
12	මුදල් විශුද්ධිකරණ විමර්ශන අංශය	29
එකතුව		**2,933**

2024.12.31 දක්වා විමර්ශන සිදුකර නීති අංශය වෙත ඉදිරිපත් කල ගොනු සංඛ්‍යාව

තීරණය	ගොනු සංඛ්‍යාව
නඩු පැවරීමට යෝජනා කල ගොනු සංඛ්‍යාව	187
වැඩිදුර විමර්ශන සඳහා යෝජනා කල (සංසන්දනයට/ නීති උපදෙස්/ ඒකාබද්ධ/ පූර්ණ රහසිගත) ගොනු සංඛ්‍යාව	1,106
ප්‍රකාශ සටහන් කරගැනීමට නියෝග ලද	80
වැසීමට යෝජනා කල ගොනු සංඛ්‍යාව	1,560
එකතුව	2,933

2.1.2.2. වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම්

අල්ලස් ලබාගැනීමේ හෝ ලබාදීමේ සිදුවීම් සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු සහ පැමිණිලිකරුගේ සහයෝගය ලැබෙන අවස්ථාවන්හිදී කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අදාල වරද සිදුවන අවස්ථාවේදී වැටලීමක් සිදුකර අත්අඩංගුවට ගැනීම් සිදුකෙරේ. 2024 වර්ෂය තුළ එවැනි වැටලීම් 116ක් සිදුකරන ලද අතර, ඉන් 53 ක් ඵලදායි විය. වැටලීම් වලදී සැකකරුවන් 86 දෙනෙකු අත්අඩංගුවට ගැනීමට හැකි විය.

2.1.2.3. වර්ෂය තුළ සිදුකල සුවිශේෂී වැටලීම්

දූෂණ විරෝධී පනත යටතේ , පැවරුණු බලතල ප්‍රකාරව පුද්ගලික අංශයේ පළමු වැටලීම 2024 ජනවාරි මස සිදු කරන ලදි. මෙහි දී දඹුල්ල ප්‍රදේශයේ, පුද්ගලික හෝටලයක මානව සම්පත් කළමණාකාරවරයෙකු විසින් එම හෝටලයේ සේවය කරන ලද නිලධාරිනියකගෙන් ලිංගික අල්ලස් ලබාගැනීමට තැත් කිරීමේ දී කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදි. එමෙන් ම රාජ්‍ය අමාත්‍යවරයෙකුගේ පුද්ගලික ලේකම්වරයෙකු රුපියල් ලක්ෂ පහළොවක මුදලක් අල්ලස් ලබාගැනීමේ දී අදාළ රාජ්‍ය අමාත්‍යවරයාගේ මඩකලපුව පිහිටි කාර්යාලයේ දී 2024 අගෝස්තු මස අත්අඩංගුවට ගන්නා ලදි. තව ද, 2024 ජනාධිපතිවරණයේ අපේක්ෂකයෙකු වශයෙන් දේශපාලන පක්ෂයකින් ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදීම සඳහා රුපියල් ලක්ෂ තුන්සීයයක අල්ලස් ලබාගැනීමේ දී අදාළ දේශපාලන පක්ෂයේ සාමාජිකයන් ඇතුළු පිරිසක් අත්අඩංගුවට ගැනීමට හැකි වීම. මෙවැනි සුවිශේෂී වැටලීම් ගණනාවක් ද ඇතුළුව 2024 වර්ෂය තුළ දී ඵලදායී වැටලීම් 53ක් සිදු කරන ලද අතර, සැකකරුවන් 86 දෙනෙක් අත්අඩංගුවට ගැනීමට හැකිව ඇත.

2.1.2.4. 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා සිදුකරන ලද වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම්

වර්ෂය	සිදුකරන ලද ඵලදායී වැටලීම් සංඛ්‍යාව	වැටලීම් වලදී අත්අඩංගුවට ගත් සංඛ්‍යාව
2020	38	45
2021	33	36
2022	32	36
2023	43	57
2024	53	86

2.1.3. නෛතික කටයුතු

විමර්ශන කටයුතු නිමකර නඩු පැවරීමට කරුණු පවතින ගොනු වලට අදාලව නඩු පැවරීමේ කාර්යය ඉටුකරනු ලබන්නේ කොමිෂන් සභාවේ නීති අංශය මගිනි. ඒ අනුව 2024 වර්ෂය තුළ නඩු 114 ක් පවරා ඇති අතර අදාල කාලය තුල අවසන් වී ඇති නඩු සංඛ්‍යාව 69 කි.

2.1.3.1. නඩු පැවරීම්

2024 වර්ෂය තුළ අධිකරණ වල පවරන ලද නඩු සංඛ්‍යාව

වරදේ ස්වභාවය	අධිකරණය		එකතුව
	මහේස්ත්‍රාත්	මහාධිකරණ	
අල්ලස්	04	66	70
දූෂණ	--	10	10
වත්කම් බැරකම් හෙලි නොකිරීම් / අයුතු වත්කම් ඉපයීම්	--	03	03
මුළු එකතුව	04	79	83

2024 වර්ෂය තුළ චූදිතයින් වූ සංඛ්‍යාව

	ආයතනය	තනතුර	නඩු පවරන ලද අධිකරණය		
			මහේස්ත්‍රාත්	මහාධිකරණ	එකතුව
1	කොළඹ මහ නගර සභාව	කාර්යාල සේවක/මාර්ග කම්කරු	1	--	1
2	----	සිවිල් පුද්ගලයින්	--	17	17
3	පොලිස් දෙපාර්තමේන්තුව	ප්‍රධාන පොලිස් පරීක්ෂක		1	19
		උප පොලිස් පරීක්ෂක	--	6	
		පොලිස් සැරයන්	--	6	
		පොලිස් කොස්තාපල්	--	6	
4	ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය- අත්තනගල්ල	ආරක්ෂක නිලධාරී	1	--	1
5	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	දුම්රිය කාර්ය සහායක	1	1	3
		දුම්රිය පනිවිටුකරු	--	1	
		අධීක්ෂණ කළමනාකරු	--		


6	මිනුම් ඒකක ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව- හම්බන්තොට	මිනුම් ප්‍රමිති සේවා සහායක	1	--	1
7	අඩවි වන කාර්යාලය- නෙදුන්කේනි, කතරගම විල්පනාගොඩ	බීට්ටු වන නිලධාරී	--	3	3
8	ශ්‍රී ලංකා මහ බැංකුව	හිටපු මහබැංකු අධිපති ඇතුළු නිලධාරීන්	--	5	5
9	ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය	සභාපති හා	--	1	
		කළමනාකාර අධ්‍යක්ෂ		1	2
10	සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය	හිටපු සිවිල් ගුවන් සේවා අමාත්‍ය	--	1	
		අමාත්‍යවරයාගේ පුද්ගලික ලේකම්	--	1	2
11	ප්‍රාදේශීය සභාව -මාතර	හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී	--	1	1
12	බප/ගම් ශ්‍රී බෝධි විදුහල- ගම්පහ බප/ශ්‍රී සුමංගල මහ විදුහල- පානදුර කොටිකාවත්ත රාජසිංහ ජාතික පාසල	විදුහල්පති	--	3	3
13	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- නුවරඑළිය	තාක්ෂණ නිලධාරී	--	2	3
	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- රත්නපුර	මිණුම් සේවා හා උපක්‍රම පරීක්ෂක	--	1	
14	ජාතික ගමනාගමන කොමිෂන් සභාව	සභාපති	--	1	1
15	ගොවිජන සේවා කාර්යාලය- අලවතුගොඩ	කෘෂිකර්ම පර්යේෂක හා නිෂ්පාදන සහකාර	--	2	2
16	මහේස්ත්‍රාත් අධිකරණය - මීගමුව	ගිණුම් සහකාර	--	1	1
17	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	වන ක්ෂේත්‍ර සහකාර	--	1	1
18	ගොවිජන සංවිධානය- සෝනුත්ත	සභාපති	--	1	1
19	පාර්ලිමේන්තු සැපයුම් හා සේවා අංශය	භාරගැනීමේ නිලධාරී	--	1	1
20	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- හඟුරන්කෙත	සංවර්ධන සම්බන්ධීකාරක නිලධාරී	--	1	1
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- ආලයඩිවෙබ්බු	සහකාර සැලසුම් අධ්‍යක්ෂ	--	1	1
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- පූනකරි	ආර්ථික සංවර්ධන නිලධාරී	--	1	1
	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය- පොතුවිල්	ඉඩම් නිලධාරී	--	1	2
		ක්ෂේත්‍ර පරීක්ෂක	--	1	
21	දිසා අධිකරණය - ගම්පහ	අධිකරණ ලිපිකරු	--	1	1

22	වනාතමුල්ල තලෙයිමන්නාරම දකුණ බොරැල්ල ආරියගම	ග්‍රාම නිලධාරී	--	4	4
23	මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් දෙපා.	සංවර්ධන සහකාර	--	1	6
		පරීක්ෂක -වැඩසටහන් සම්පාදක	--	1	
		ඉඩම් කොමසාරිස් ජනරාල් (එවකට)	--	1	
		විමර්ශන නිලධාරී	--	2	
		කළමනාකරණ සහකාර	--	1	
24	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	ඉඩම් නිලධාරී - එච් කලාපය	--	1	3
		ඒකක කළමනාකරු	--	1	
		අධ්‍යක්ෂ -මහවැලි ආරක්ෂක බලකාය	--	1	
25	ගිනි නිවීම් ඒකකය - අනුරාධපුර මහ නගර සභාව	ස්ථාන භාර නිලධාරී	--	1	1
26	ශ්‍රී ලංකා මහ බැංකුව	හිටපු මහබැංකු අධිපති ඇතුළු නිලධාරීන් (නිදහස් වූ නඩුවක් නැවත පැවරීමකි)	--	5	5
27	ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය	අධ්‍යක්ෂ- ජීව වෛද්‍ය ඉංජිනේරු	--	1	1
28	සෞඛ්‍ය අමාත්‍යාංශය	මහජන සෞඛ්‍ය පරීක්ෂක	--	1	1
29	ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය	වැ.බ ධාවන කළමනාකරු	--	1	1
30	ශ්‍රී ලංගම	ප්‍රාදේශීය ධාවන කළමනාකරු	--	2	2
31	මධ්‍යම සංස්කෘතික අරමුදල	ව්‍යාපෘති කළමනාකරු	--	1	1
32	අධිකරණ අමාත්‍යාංශය	දිසා/ මහේ අධිකරණය තෙල්දෙණිය	--	1	1
33	බන්ධනාගාර දෙපාර්තමේන්තුව	හිටපු බන්ධනාගාර අධිකාරි	--	1	1
34	ජාතික ජලසම්පත් හා ජලාපවාහන මණ්ඩලය	කම්කරු	--	1	1
35	පුරා විද්‍යා දෙපාර්තමේන්තුව	පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්	--	1	4
		ප්‍රධාන ගණකාධිකාරි	--	1	
		ගණකාධිකාරි	--	1	
		ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ	--	1	
36	මහනගර සභාව - මහනුවර	නාගරික මන්ත්‍රී	--	2	2
37	පුද්ගලික ආයතනයකි	ආරක්ෂක නිලධාරී	--	1	1
38	සිරිමාවෝ බණ්ඩාරනායක ළමා රෝහල	මහජන සෞඛ්‍ය පරීක්ෂක	--	1	1
39	නාගරික සංවර්ධන අධිකාරිය	සැළසුම් නිලධාරී	--	1	1

40	ක්වාති අධිකරණය-කොළඹ, උතුර	ක්වාති විනිසුරු	--	1	1
41	මාර්ගස්ථ මගීප්‍රවාහන අධිකාරිය	කාර්යාල කාර්ය සහායක	--	1	1
42	අධිකරණ අමාත්‍යාංශය	ඇක්සීසි ක්‍රියාකරු	--	1	1
එකතුව			4	110	114

2020 වර්ෂයේ සිට **2024** වර්ෂය දක්වා පවරන ලද නඩු පිළිබඳ තොරතුරු

වර්ෂය	අල්ලස් නඩු	දූෂණ නඩු	අයුතු වාසි ඉපයීම් පිළිබඳ නඩු	වත්කම් බැරකම් හෙළි නොකිරීම් පිළිබඳ නඩු	එකතුව
2020	47	1	2	--	50
2021	58	2	--	2	62
2022	62	26	--	1	89
2023	55	3	2	--	60
2024	70	10	3	--	83



2.1.3.2. නඩු අවසන් කිරීම

2024 වර්ෂය තුළ අවසන් වූ නඩු පිළිබඳ තොරතුරු


වරදේ ස්වභාවය	මහේස්ත්‍රාත්						මහාධිකරණ						මුළු එකතුව
	වරදකරු	නිදොස්කොට නිදහස්	නිදහස් කිරීම්	ඉල්ලා අස්කර ගැනීම්	වෙනත්	එකතුව	වරදකරු	නිදොස්කොට නිදහස්	නිදහස් කිරීම්	ඉල්ලා අස්කර ගැනීම්	වෙනත්	එකතුව	
අල්ලස්	4	7	--	--	--	11	21	17	8	1	4	51	62
දූෂණ	--	--	--	--	2	2	1	--	3	1	--	5	7
අයුතු වත්කම් ඉපයීම්/ වත්කම් බැරකම් හෙළි නොකිරීම්	--	--	--	--	--	--	--	--	--	--	--	--	--
එකතුව	4	7	--	--	2	13	22	17	11	2	4	56	69

2024 වර්ෂය තුළ නඩු පැවරීම් තුලින් රජය ලද ආදායම්

මහේස්ත්‍රාත් අධිකරණයේ දඩ මුදල්	රු. 39,500.00
මහේස්ත්‍රාත් අධිකරණයේ දණ්ඩන මුදල්	රු. නැත
මහේස්ත්‍රාත් අධිකරණයේ වන්දි මුදල්	රු. 50,000.00
මහාධිකරණයේ දඩ මුදල්	රු. 899,500.00
මහාධිකරණයේ දණ්ඩන මුදල්	රු. 500,230,500.00
මහාධිකරණයේ වන්දි මුදල්	රු. නැත
රාජසන්තක කරන ලද මුදල	රු. 290,000.00

2020 වර්ෂයේ සිට **2024** වර්ෂය දක්වා අවසන් වූ නඩු පිළිබඳ තොරතුරු

වර්ෂය	අල්ලස් නඩු	දූෂණ නඩු	අයුතු වත්කම් ඉපයීම් සම්බන්ධ නඩු	වත්කම් බැරකම් හෙළි නොකිරීම් සම්බන්ධ නඩු	එකතුව
2020	52		3	--	55
2021	62		5	2	69
2022	90		--	7	97
2023	58	10	1	--	69
2024	62	7	--	--	69



2024 වර්ෂය තුළ නඩු තීන්දු මගින් විත්තිකරුවන් වරදකරුවන් බවට පත්වූ අය පිළිබඳ විස්තර

අනු අංකය	ආයතනය	වරදකරුවන් වූ නිලධාරියාගේ තනතුර	වරදකරුවන් වූ සංඛ්‍යාව	වරදකරුවන් වූ නඩු සංඛ්‍යාව
01.	පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - සබරගමුව	ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු	01	01
02.	මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය	ධාවන කළමනාකරු	01	01
03.		සිවිල් පුරවැසියන්	10	09
04.	ලංකා විදුලිබල මණ්ඩලය	කාර්යාල කාර්යය සහායක	01	01
05.	පොලිස් දෙපාර්තමේන්තුව	පොලිස් සැරයන්	04	06
		පොලිස් කොස්තාපල්	02	
06.	ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය- අත්තනගල්ල	ආරක්ෂක නිලධාරී	01	01
07.	නවගම්පුර වසම	ග්‍රාම නිලධාරී	01	03
	ඩයගම ග්‍රාම නිලධාරී		01	
	පල්ලේගම- ග්‍රාම නිලධාරී		01	
08.	ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	හිටපු ආපදා කළමනාකරණ අමාත්‍ය	01	01
09.	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	අධීක්ෂණ කළමනාකරු	01	02
		දුම්රිය පනිවිටුකරු	01	
10.	ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව	සහකාර රේගු අධිකාරී	01	01
		රේගු අධිකාරී	03	
එකතුව			**30**	**26**

වර්ෂය තුළ චූදිතයන් වරදකරුවන් බවට පත්වූ සුවිශේෂී නඩු

2024 වසර තුළ චූදිතයන් වරදකරුවන් කරමින් ලැබුණු නඩු තීන්දු 26 අතුරින් විශේෂිත ම නඩු තීන්දුවක් ලෙස ශ්‍රී ලංකා රේගුවේ හිටපු රේගු අධිකාරීන් තිදෙනෙකුට සහ සහකාර රේගු අධිකාරිවරයෙකුට එරෙහිව ලැබුණු නඩු තීන්දුව දැක්විය හැකිය. මෙහි දී එක් වරදකරුවෙකුට රුපියල් මිලියන එකසිය විසිපහක් බැගින් වරදකරුවන් හතර දෙනාට රුපියල් මිලියන පන්සියයක දඩ මුදල් ගෙවීමට නියම වූ අතර, එක් අයෙකුට වසර තිස්පහ බැගින් සිර දඬුවම්ද නියම විය. මෙය මෑතකාලීන නඩු තීන්දු අතරින් සුවිශේෂී නඩු තීන්දුවක් විය. එමෙන් ම, ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය වෙත ලබා දී තිබූ සුඛෝපභෝගී ජීප් රථයක් තම පුද්ගලික පරිහරණයට භාවිතා කිරීම සහ එහි නඩත්තු කටයුතු වෙනුවෙන් රුපියල් මිලියනයකට වැඩි මුදලක් වැය කිරීම පිළිබඳ වරදකරුවෙකු වූ හිටපු ආපදා කළමණාකරණ අමාත්‍යාවරයෙකුට වසර 10කට අත්හිට වූ වසර 02ක සිර දඬුවම් හිමි වීම ද සුවිශේෂී තත්ත්වයකි.

2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පවරණ ලද නඩු සංඛ්‍යාව, අවසන් කරන ලද නඩු සංඛ්‍යාව සහ විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව

වර්ෂය	පවරන ලද නඩු			අවසන් කරන ලද නඩු			විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව
	මහාධිකරණය	මහේස්ත්‍රාත් අධිකරණය	එකතුව	මහාධිකරණය	මහේස්ත්‍රාත් අධිකරණය	එකතුව	
2015	76	32	108	41	11	52	15
2016	43	44	87	26	08	34	15
2017	41	32	73	68	20	88	57
2018	36	16	52	84	26	110	64
2019	37	09	46	75	19	94	54
2020	42	08	50	46	09	55	28
2021	57	05	62	43	26	69	09
2022	77	12	89	64	32	96	22
2023	56	04	60	60	09	69	19
2024	79	04	83	56	13	69	30

2.1.3.3. විභාග වෙමින් පවතින නඩු

2024 දෙසැම්බර් මස 31 දින වනවිට අධිකරණවල නඩු 259ක් විභාග වෙමින් පවතී. ඒ පහත පරිදිය.

මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 26

මහාධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 231

ත්‍රිපුද්ගල මහධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 02

2.1.4. නිවාරණය

අල්ලස හා දූෂණයෙහි අනිසි ප්‍රතිවිපාකයන් සහ අල්ලස හා දූෂණයට එරෙහිවීම මෙන්ම වැළැක්වීමේ ක්‍රමවේද පිළිබඳව දැනුවත් කිරීම සඳහා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, අධ්‍යාපන ක්ෂේත්‍රය හා මහජනතාව ඉලක්ක කරගනිමින් දීප ව්‍යාප්තව දූෂණ නිවාරණ වැඩ සටහන් පැවැත්වීමට කොමිෂන් සභාව පියවර ගෙන ඇත.

2.1.4.1. 2024 වර්ෂය තුළ පවත්වන ලද නිවාරණ වැඩ සටහන් පිළිබඳ සාරාංශගත තොරතුරු

වැඩ සටහන් පැවැත්වූ ආයතනය	සංඛ්‍යාව
රාජ්‍ය/ පළාත් රාජ්‍ය ආයතන වල නිලධාරීන් සඳහා	72
අර්ධ රාජ්‍ය ආයතන වල නිලධාරීන් සඳහා	45
පුද්ගලික ආයතන වල නිලධාරීන් සඳහා	11
වෙනත් පාර්ශවයන්/ පුද්ගලයන් සඳහා	2
ජනමාධ්‍ය මගින් පවත්වන ලද වැඩ සටහන්	9
මුළු වැඩසටහන් සංඛ්‍යාව	**139**

2.1.4.2. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් වෙන් කරන ලද අරමුදල් පදනම් කර ගනිමින් පවත්වන ලද දූෂණ නිවාරණ වැඩසටහන්

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හි මූල්‍ය සහයෝගීතාවය මත JURE (යුක්තිය සඳහා සහාය) වැඩසටහන යටතේ පළාත් 09ම ආවරණය වන පරිදි ප්‍රමුඛ රාජ්‍ය නිළධාරීන් 400 දෙනෙකු පමණ දූෂණ නිවාරණය පිළිබඳව පුහුණුකරුවන් ලෙසද සුපිළිපන්න නිළධාරීන් 1000ක් පමණද පුහුණු කිරීම මේ යටතේ සිදුවිය. එමෙන්ම දූෂණය ඇති වීම පිළිබඳව වැඩි නැඹුරුවක් පවතින බවට හඳුනාගත් ක්ෂේත්‍රයන්හි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන් වල දැනුවත් කිරීමේ වැඩසටහන්ද මේ යටතේ පවත්වන ලදි.ඒ අනුව 2023 වර්ෂයේ පවත්වන ලද වැඩසටහන් වලට අමතරව 2024 වර්ෂයේදී පහත වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදි.

අනු අංකය	දිනය	වැඩසටහන	ස්ථානය
1	20.01.2024	Awareness raising/training programmes & on the job training opportunities for public officers RMV/IRD	Shanaya Motel-Matara
2	23.01.2024	Conduct training programs for integrity officers	Hotel Grand Guardian - Kuruwita
3	24.01.2024	Experience sharing session & dialogues to exchange best practices between Institutions	Taj Samudra - Colombo
4	09.02.20024 – 11.02.2024	Train 400 Officers, one officer each from one institution under the three – day residential training programme to train trainers in all Government Institutions	Centauria lake – Elpitiya - Rathnapura

5	13.03.2024	Conduct awareness raising /training programmes & on- the job training opportunities for Community Police Officers	Green Grass & Restaurant - Jaffna
6	14.03.2024	Conduct awareness raising /training programmes & on- the job training opportunities for Community Police Officers- 02 programms	Moju Banquest Hall - Vavunia
7	3-Apr-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Araliya Red-Nuwara eliya
8	4-Apr-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Oakray Restaurant-Kandy
9	5-Apr-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Hotel swiss Dale-Mathale
10	29-Apr-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Public Officers	Slida-Colombo
11	11-May-24	Conduct training programms for integrity officers	Badulla Heritage-Uva Province
12	10/11/12-May-24	Train 400 Officers, one officer each from one institution under the three-day residential training programme to train trainers in all Government Institution	Araliya Grand Hills-Uva Province
13	12-May-24	Conduct quarterly sessions for sharing experience & best practices related to anti-corruption & Orevention with civil society-Railway station	Nuwara Eliya
14	18-May-24	Conduct training programms for integrity officers	Citrus-Southern Province
15	17/18/19-May-24	1Train 400 Officers, one officer each from one institution under the three-day residential training programme to train trainers in all Government Institution	Citrus-Southern Province
16	11-Jun-24	Conduct awareness program on integrity, anti corruption & values for education sector-Integrity programs For Schools	Jade Green Hambanthota
17	12-Jun-24	Conduct awareness program on integrity, anti corruption & values for education sector-Integrity programs For Schools	kanvel-Monaragala

18	13-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Rajarata Hotels Property Management
19	14-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Chilaw far Inn-Chilaw
20	15-Jun-24	Conduct awareness raising/ training programmes and on the job training for members of statutory boards	Taj Samudra
21	19-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Garden Beach-Kalutara
22	20-Jun-24	Conduct awareness program on integrity, anti corruption & values for education sector-Prevention programme for Educational Officers & School prefects	Green Grass Hotel & Restaurant-Jaffna
23	20-Jun-24	Conduct training programms for integrity officers	Ramada-Colombo
24	24-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Public Officers	SLIDA
25	25-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Polhena Grand Resort-Matara
26	26-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Jade Green Hambanthota
27	27-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Kethumathee Hotel & Banquet
28	29-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Public Officers	Asliya Jaoda-Kurunegala
29	28-29-30/June/2024	Train 400 Officers, one officer each from one institution under the three-day residential training programme to train trainers in all Government Institutions	Colombo
30	Anti-corruption and integrity to be introduced/ revised as a module in training programmes for public officers		

2.1.5. වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම

ශ්‍රී ලංකාව තුළ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය විශාල වෙනසකට භාජනය කරමින් 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත මගින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ සත්‍යායනය කිරීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැවරී ඇත. කොමිෂන් සභාව විසින් පාලනය කරනු ලබන මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියක් මගින් මෙම කටයුතු සිදුකළයුතුව පවතී. මෙහිදී වත්කම් හා බැරකම් හෙළිදරව් කළ යුතු තැනැත්තන් පිළිබඳව වපසරියද සුවිශාල වශයෙන් පුළුල් කර ඇති අතර පනතේ 80(1) වගන්තිය ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු පුද්ගල කාණ්ඩ 31ක් එහි දක්වා ඇත.

පනතේ 88(1) වගන්තිය අනුව මෙම වත්කම් හා බැරකම් ප්‍රකාශ සඳහා මහජනතාවට ප්‍රවේශ වීමටද අවස්ථාව ලබාදිය යුතු බව දක්වා ඇති අතර, නව මධ්‍යගත ඉලෙක්ට්‍රොනික් පද්ධතියේ කටයුතු ආරම්භ කරන තෙක් 2024 වර්ෂය සඳහාද සාමාන්‍ය පරිදි වත්කම් හා බැරකම් ප්‍රකාශ අදාළ ආයතන ප්‍රධානීන් වෙත භාරදීමට අදාලව (ජනාධිපති, අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍යවරුන්ට) අදාල ප්‍රකාශ පමණක් කොමිෂන් සභාව විසින් භාරගනිමින්) කොමිෂන් සභාව විසින් 2024.03.01 දිනැතිව 01/2024 නැමති චක්‍රලේඛය නිකුත් කරන ලදි. ඒ අනුව, රාජ්‍ය ධුරාවලි ලැයිස්තුවේ ඉහළින් සිටින 300 දෙනෙකුගේ පමණ 2024 වර්ෂයට අදාළ වත්කම් හා බැරකම් ප්‍රකාශ වල සංස්කරණය කරන ලද (පනතේ 88(1) අනුව) පිටපත් කොමිෂන් සභා වෙබ් අඩවිය තුළින් ජනතා ප්‍රවේශයට විවෘත කරන ලදි. ඊට අමතරව 2024 ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ අපේක්ෂකයින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ සඳහාද ජනතා ප්‍රවේශය ලබාදෙන ලදි.

වත්කම් හා බැරකම් ප්‍රකාශ සඳහා 2024 වර්ෂයේදී ජනතා ප්‍රවේශය ලබාදුන් තැනැත්තන් පිළිබඳ විස්තර.

අනු අංකය	කාණ්ඩය	හෙළිදරවු කළ යුතු සංඛ්‍යාව	හෙළිදරවු කළ සංඛ්‍යාව	හෙළිදරවු නොකළ සංඛ්‍යාව
1	ජනාධිපති	1	1	0
2	අග්‍රාමාත්‍ය, කථානායක, අගවිනිසුරු	3	3	0
3	විපක්ෂ නායක, කැබිනට් අමාත්‍යවරු, ෆීල්ඩ් මාර්ෂල්, මහබැංකු අධිපති	19	18	1
4	පළාත් ආණ්ඩුකාරවරු	9	5	4
5	රාජ්‍ය අමාත්‍යවරු	36	30	6
6	නියෝජ්‍ය කතානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරු, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක	3	3	0
7	තානාපතිවරු මහ කොමසාරිස්වරුන් ඇතුළු විදේශීය දූත මණ්ඩල නිළධාරීන්	75	48	27
8	ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින්	3	3	0
9	නීතිපති, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්, අභියාචනාධිකරණයේ සභාපති සහ අභියාචනාධිකරණ විනිසුරුවරුන්	31	30	1
10	පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් (ඉහත සඳහන් කල අය හැර)	166	166	0
11	ජනාධිපතිවරණ අපේක්ෂකයන්	39	39	0
එකතුව		385	346	39

2.2. අභියෝග

1. විවිධ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂඥ දැනුමක් සහිත විශේෂිත විමර්ශන නිලධාරීන් ආයතනය සතු නොවීම
2. දූෂණ නඩු උසාවියේ ඔප්පු කිරීම සඳහා ලේඛන මත පදනම් වූ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වුවත් එවැනි සාක්ෂි සපයා ගැනීම දුෂ්කර වීම
3. අල්ලස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයන්ට ප්‍රමාණවත් කාර්යාල ඉඩ පහසුකම් නොමැතිවීම
4. රජයේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන ක්‍රියාපටිපාටිය අනුව සිදු වන වංචා හා දූෂණ ලිපි ලේඛණ තුලින් අණාවරණය කර ගැනීමට නොහැකි වීම
5. කාර්යාල පරිශ්‍රයෙන් දුර බැහැර ප්‍රදේශ වල සිට පැමිණීමට නියමිත සාක්ෂිකරුවන් හා පැමිණිලිකරුවන්ට ගමන් වියදම් දරා ගැනීමට ඇති අපහසුතාවය නිසා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට ඇති නොහැකියාව
6. දූෂිත රාජ්‍ය නිලධාරීන් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට සහ අවශ්‍ය අවස්ථාවල දී සාක්ෂි ලබා දීමට ජනතාව දක්වන සහයෝගය අවම මට්ටමක පැවතීම
7. දේශපාලඥයින්ගේ මහා පරිමාණ අල්ලස් හෝ දූෂණ පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට ව්‍යාපාරිකයින්, ආයෝජකයින් වැනි පාර්ශව ඉදිරිපත් නොවීම
8. අල්ලසට හා දූෂණයට එරෙහි වැඩපිළිවෙලක් රාජ්‍ය අංශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ඇති උනන්දුව අවම මට්ටමක පැවතීම

2.3. ඉදිරි ඉලක්ක

1. මෙතෙක් කොළඹ අධිකරණ බල ප්‍රදේශයට සීමා වී ඇති කොමිෂන් සභාවේ අධිකරණ බලසීමාව මුළු දිවයිනටම පුළුල් වන සේ ව්‍යාප්ත කිරීම හා ප්‍රාදේශීය විමර්ශන කටයුතු ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමේ මූලික කටයුතු ආරම්භ කිරීම.
2. 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත මගින් කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්ය භාරය ඉටුකිරීම සඳහා කොමිෂන් සභාවේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් නිම කිරීම
3. අල්ලස් කොමිෂන් සභාවේ ලිපි ගොනු කළමනාකරණය සඳහා පරිගණක ගත දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම.
4. මාර්ගගත (Online) ක්‍රමය භාවිතා කරමින් රාජ්‍ය නිළධාරීන්ගේ හා දේශපාලඥයින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීම සහ එම වත්කම් බැරකම් ප්‍රකාශ වලට අදාල තොරතුරු අල්ලස් කොමිෂන් සභාවේ පිහිටවනු ලබන විශේෂ ඒකකයක පරිගණක ගත දත්ත පද්ධතියක් ලෙස ස්ථාපිත කිරීම.
5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා අවශ්‍ය කාර්යාල පහසුකම් සංවර්ධනය කර ගැනීම.
6. පාසල් හා උසස් අධ්‍යාපනය හදාරන සිසුන්ගේ ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා සාරධර්ම සංකල්ප හා අල්ලස දූෂණය පිළිබඳ නීති අධ්‍යාපන විෂය මාලාවන්ට ඇතුළත් කිරීම.

තෙවන පරිච්ඡේදය

3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් (i)-(viii)

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය


3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය



ඒසිඒ-එල්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	2023 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		596,490,174	412,472,720	ඒසිඒ-3
-	නැන්පතු		24,505,225	62,817,204	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		25,344,306	42,800,286	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**646,339,705**	518,090,209.75	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**646,339,705**	518,090,209.75	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		31,726,329	11,573,706	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		614,613,376	506,516,503.29	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
568,660,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	551,842,400	449,152,940	
254,574,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	162,819,738	125,976,718	ඒසිඒ-2(ii)
3,250,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	792,234	825,006	
-	පොළී ගෙවීම්	8		-	
36,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	35,500	5,955	
826,520,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**715,489,872**	575,960,619.65	
	මූලධන වියදම්				
31,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	22,996,509	14,268,334	
15,920,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	13,778,293	1,380,119	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12		-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13		-	
2,900,000	හැකියා වර්ධනය	14	1,047,998	643,093	
74,100,000	වෙනත් මූලධන වියදම්	15	61,149,120	51,765,091	
123,920,000	මුළු මූලධන වියදම් (උ)		**98,971,921**	68,056,636	
	නැන්පතු ගෙවීම්		24,157,896	62,742,379	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		82,468,882	39,774,925	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		106,626,778	102,517,304	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		921,088,570	746,534,559	
950,440,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(306,475,194)	(240,018,056)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(307,101,813)	(240,018,056)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		626,618		ඒසිඒ-3
			(306,475,194)	(240,018,056)	

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	2,216,657,523	2,174,067,906
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	124,701,409	67,576,833
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	626,618	-
මුළු වත්කම්		**2,341,985,551**	**2,241,644,739**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		124,247,694	67,470,447
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,216,657,523.19	2,174,067,906
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ප්‍රගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	453,715	106,386
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	626,618	-
මුළු වගකීම්		**2,341,985,551**	**2,241,644,739**

පිටු අංක 7 සිට 29 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 30 සිට 36 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත.** ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.


ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :ආර්.එස්.ඒ.දිසානායක
තනතුර :අධ්‍යක්ෂ ජනරාල්
දිනය :2025 පෙබරවාරි 25

ආර්.එස්.ඒ. දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ පෝදනා විමර්ශන කොමිසෙන් සභාව
අංක: 36, ඉලන්සේකර මාවත, කොළඹ 07.

ප්‍රධාන ගණකාධිකාරි
නම :ඩබ්.එම්.ඩී.ඛණ්ඩාර
දිනය :2025 පෙබරවාරි 21

ඩබ්ලිව්.එම්.ඩී. ඛණ්ඩාර
ප්‍රධාන ගණකාධිකාරි
අල්ලස් හෝ දූෂණ පෝදනා කොමිසම් සභාව
36, ඉලන්සේකර මාවත, කොළඹ 07.

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය



ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තනතා	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	9,900,304	8,721,507
අග්‍රිම ලැබීම්	561,140,174	350,689,000
අත්තිකාරම් අයකර ගැනීම්	27,465,293	39,782,951
තැන්පතු ලැබීම්	24,505,225	62,817,204
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**623,010,996**	**462,010,662**
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	418,021,292	410,420,265
සහනාධාර සහ මාරුකිරීම්	792,234	825,006
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	1,720,852	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	31,726,329	11,573,706
අත්තිකාරම් ගෙවීම්	82,468,882	36,950,987
තැන්පතු ගෙවීම්	24,157,896	62,742,379
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**558,887,484**	**522,512,344**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**64,123,512**	**(60,501,682)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් විකිණීම්	125,027	98,080
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**125,027**	**98,080**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	98,971,921	1,380,119
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**98,971,921**	**1,380,119**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(98,846,894)**	**(1,282,039)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(34,723,382)**	**(61,783,720)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	35,350,000	61,783,720
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**35,350,000**	**61,783,720**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**35,350,000**	**61,783,720**
මුදල්වල ඉද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	626,618	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	626,618	-

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

ඇමුණුම - (i)

(මු.රෙ. 106 හා මූ.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය:010

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

වැඩසටහන් අංකය හා නාමය :

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	3	55,000.00
රු	25,000.01	වැඩි	4	226,775.00
	එකතුව		7	281,775.00

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය			සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
25000ට අඩු			25000ට වැඩි	
1 PG-1338	රු	24,700.00	1 CAC-6985	61,500.00
2 PG-0603	රු	5,300.00	2 NB-5064	108,075.00
3 KS-7595	රු	25,000.00	3 PG-0601	29,500.00
			4 CAC-6970	27,700.00
එකතුව		55,000.00		226,775.00

(ii) කවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු	-	-
රු	25,000.01	වැඩි	-	-
	එකතුව			

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය		සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1	-	-	
	එකතුව	-	-

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	7
	ගණන	රු226,775.00
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	-
	ගණන	රු -
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	-
	ගණන	රු -

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මූ.රෙ. 106 යටතේ වන හානි හා මූ.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....

ප්‍රධාන ගණකාධිකාරි

නම :ඩබ්.එම්.ඩී.බණ්ඩාර

දිනය :2025 පෙබරවාරි 21

ඩබ්ලිව්.එම්.ඩී. බණ්ඩාර
ප්‍රධාන ගණකාධිකාරි
අල්ලස් හෝ දූෂණ චෝදනා
විමර්ශන කොමිෂන් සභාව
07.

ඇමුණුම -(ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : (අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

වැඩසටහන් අංකය හා නාමය:

1 **වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය**

අගය		සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	-	-
(ii)	රු. 25,000.01 වැඩි	1	35,500.00
	එකතුව	1	35,500.00

2 **වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය**

	අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1	සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමට යාමේදී අනපේක්ෂිතව පලායාමට උත්සාහ දැරීමේදී ඔහු සමග පොර බැඳීම හේතුවෙන් ජංගම දුරකථනය අස්ථානගත වීම	35,500.00	35,500.00	-	35,500.00	-	BC/E/06/13
	එකතුව	35,500.00	35,500.00	-	35,500.00	-	

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මූ.රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

ඩබ්ලිව්.එම්.ඩී. බණ්ඩාර
ප්‍රධාන ගණකාධිකාරී
අල්ලස් හෝ දූෂණ චෝදනා
විමර්ශන කොමිෂන් සභාව

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී.බණ්ඩාර
දිනය :2025 පෙබරවාරි 21

වාර්ෂික කාර්ය සාධන වාර්තාව CIABOC 2024

දෙසැම්බර් **31** දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

ඇමුණුම - (iii)

Cumulative Commitment/ Liability Report for the Year - 2024

To
Commission to Investigate Allegation of Bribery Corruption (010)
From
Director General, ,
Department of State Accounts, ,
General Treasury, Colombo1. .

Printed by **snilmini**
New Table No **:SA-92**
Old Table No :--
Report Date 2/20/2025 2:19:43 PM

NEW CIGAS FINAL 2024 REPORTS

Nature	Commit_No	Date	To_whom	Vote	Commitment	Commit_bal	L_Date	Liability_amt	Revised_Lia	Paid	Liability_Bal	Reported_By
SOE	2104	31 Dec 2024	Ceylon Electricity Board	010-1-1-0-1403-P	5,986,785.07	0.00	31 Dec 2024	5,986,785.07	0.00	0.00	5,986,785.07	010

This is a computer-generated document. No signature is required.
Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan -Director, Dept of State Accounts.
-

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
වියදම් ශීර්ෂ අංකය:010
වැඩසටහන් අංකය හා නාමය:

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
එල්.එස්.කේ.කැකුණාවල හා වෙනත්	ගමන් වියදම්	1	0	1101	11			9,800.00
අයි.ඒ.ටී.එස්.පුෂ්පකුමාර	විවිධ සේවා වියදම්	1	0	1409(140)	11			4,604.03
යූ.පී.වික්‍රමාරච්චි	විවිධ සේවා වියදම්	1	0	1409(140)	11			6,000.00
එම්.ඒ.ආර්.රණසිංහ	විවිධ සේවා වියදම්	1	0	1409(140)	11			5,341.58
ජේ.එම්.ඩී.ඒ.කේ.ජයමාන්න	විවිධ සේවා වියදම්	1	0	1409(140)	11			3,600.00
ජේ.එස්.ජයවීර	විවිධ සේවා වියදම්	1	0	1409(140)	11			800.00
එකතුව								30,145.61
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
ශ්‍රී ලංකා ටෙලිකොම්	තැපැල් හා සන්නිවේදන	1	0	1402	11			184,832.55
ලංකා විදුලි බල මණ්ඩලය	විදුලිය	1	0	1403	11			957,433.32
ලංකා විදුලි බල මණ්ඩලය	විදුලිය	1	0	1403	11			761,950.06
ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	ජලය	1	0	1403	11			116,426.67
ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	ජලය	1	0	1403	11			155,040.20
ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	ජලය	1	0	1403	11			86,899.13
ලංකා විදුලි බල මණ්ඩලය	විදුලිය	1	0	1403	11			5,986,785.07
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	ආරක්ෂක සේවා	1	0	1407	11			312,800.00
එකතුව								8,562,167.00

වාර්ෂික කාර්ය සාධන වාර්තාව CIABOC 2024

3. වෙනත් (පෞද්ගලික අංශය)								
ඇසෝසියේටඩ් මෝටර්වේස්	වාහන නඩත්තු	1	0	1301	11			413,372.99
ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන්	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	1	0	1302	11			118,444.98
ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්	තැපැල් හා සන්නිවේදන	1	0	1402	11			42,125.89
ඇමෙරිකන් ප්‍රිමියම් වෝටර් සිස්ටම්	ජලය	1	0	1403	11			3,435.96
සුප්‍රීම් ෆර්බලිෂර්ස්	පිරිසිදු කිරීම් හා පවිත්‍රතා	1	0	1405	11			1,045,704.94
එකතුව								1,623,084.76
මූළු එකතුව								**10,215,397.37**

ප්‍රධාන ගණකාධිකාරි

නම :ඩබ්.එම්.ඩී.බණ්ඩාර

දිනය :2025 පෙබරවාරි 21

ඩබ්ලිව්.එම්.ඩී. බණ්ඩාර
ප්‍රධාන ගණකාධිකාරි
අග්නිදිග ගෝ සුපිරිම පෙට්‍රෝලියම්
පිරිසිදුකරණ සමාගම් සංකීර්ණය

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (ii)

මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :

වියදම් ශීර්ෂ අංකය :

වැඩසටහන් අංකය හා නාමය :

පුද්ගලයාගේ/ආයතනයේ නම* (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය)	වගකීම් පිළිබඳ විස්තරය	ණයවර ලිපි අංක ආදිය	ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද				තැන්පතු ගිණුම් අංකය	මාරුකරන ලද මුදල රු.
			ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය		
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු .... එකතුව	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 05/2023 අනුව මෙම ආයතනයට අදාල නොවේ							XX XX
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල .... එකතුව								XX XX
3. වෙනත් (පෞද්ගලික අංශය) .... එකතුව								XX XX
මුළු එකතුව								

වාර්ෂික කාර්ය සාධන වාර්තාව CIABOC 2024

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :

වැඩසටහන් අංකය හා නාමය :

		රු.
(1)	ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ , පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2024 ඇස්තමේන්තුගත වෙන්කිරීම්	.....
(2)	ඉහත (1) ට අදාළ 2024 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම්	.....
(3)	2024 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව	.....
(4)	2023 හා ඊට පෙර වර්ෂවලට අදාළව , 2024 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (ඇත්නම්)	.....
(5)	2024 වර්ෂය සම්බන්ධයෙන් 2024 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව	.....
(6)	2023 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2024 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල	.....
(7)	2024 වර්ෂය සම්බන්ධයෙන් 2024 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල එකතුව	.....
(8)	2023 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2024 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව	.....
(9)	2024 වර්ෂය වෙනුවෙන් 2024 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	.....
(10)	2024 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව {(3+4+5) - (6+7)} - (8+9)	.....
(11)	මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2024 වර්ෂය සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි	.....
(12)	මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2024 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	.....
(13)	මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (10 + 11 - 12)	.....

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

අල්ලස් හෝ දූෂණ වෝදනා විමර්ශන කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය:010

වැඩසටහන් අංකය හා නාමය:

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
-	-	-	-	-

ඩබ්ලිව්.එම්.ඩී. බණ්ඩාර
ප්‍රධාන ගණකාධිකාරී
අල්ලස් හෝ දූෂණ වෝදනා
විමර්ශන කොමිෂන් සභාව
07.

ප්‍රධාන ගණකාධිකාරී

නම :ඩබ්.එම්.ඩී.බණ්ඩාර

දිනය :2025 පෙබරවාරි 21

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2024.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය:010

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2024.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇනොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	ලංකා බැංකුව, ටොරින්ටන් ශාඛාව	7040057	16,628,865.55	-	-	2025 ජනවාරි

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

.....

ප්‍රධාන ගණකාධිකාරී

නම :ඩබ්.එම්.ඩී.බණ්ඩාර

දිනය :2025 පෙබරවාරි 21

ඩබ්ලිව්.එම්.ඩී. බණ්ඩාර
ප්‍රධාන ගණකාධිකාරී
අධ්‍යාපන අමාත්‍යාංශය
විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා

07.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ඒඩිඒ - 1

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය


ආදායම් ගණන් දීමේ නිලධාරි :

වියදම් ශීර්ෂ අංකය :

රු.

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	සටහන	ආදායම් ඇස්තමේන්තුව (1)		ආදායම් රැස්කිරීම (2)			(3)	ආදායමෙන් ආපසු ගෙවීම (4)			(5)
			මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම	වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම (SA-21)	එකතුව	නිඹ ආදායම් රැස්කිරීම්	මුදලින්	වැරදි නිවැරදි කිරීම	එකතුව	ශුද්ධ ආදායම
			1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=2(iii)+(3)-4(iii)
	ආදායම් බද්ද	1										
1004.01.01	ආදායම් බද්ද											
1004.01.02	ලාභාංශ බද්ද											
1004.01.03	ප්‍රේෂණ බද්ද											
1004.01.00	මූල්‍ය සාම්ප්‍රතික බද්ද		මෙම ආයතනය ආදායම් එකතු කරන ආයතනයක් නොවන බැවින් අදාල නොවේ									
1004.02.01	උපයන විට ගෙවීම් බද්ද											
1004.02.99	අනෙකුත්											
1004.03.00	රඳවා ගැනීමේ බදු											
1004.03.01	පොළිය මත											
1004.03.99	ගාස්තු සහ වෙනත්											
1004.04.00	ආර්ථික සේවා ගාස්තු											
1004.04.01	දේශීය											
1004.04.02	විදේශීය											
1004.05.00	ප්‍රාග්ධන ලාභ බද්ද											
1004.06.00	ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම් මත බද්ද											
1004.02.00	මූල් සාම්ප්‍රතික නොවන බද්ද (අ)											
	මූල් ආදායම් බද්ද (අ+අ)											
	දේශීය භාණ්ඩ හා සේවා මත බද්ද	2										
1002.01.00	එකතු කළ අගය මත බද්ද											
1002.01.01	මූල්‍යමය සේවාවන්											

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය



ඒඅයි -2

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය :010

රු.

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමේ නම	අවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.අ.ප. 66/69 මාරු කිරීම (3)	මුළු ඉද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ඉද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	739,000,000	89,440,000	(1,920,000)	826,520,000	715,489,872	111,030,128
	(2) ප්‍රාග්ධන	122,000,000	-	1,920,000	123,920,000	98,971,921	24,948,079
	උප එකතුව	861,000,000	89,440,000	-	950,440,000	814,461,793	135,978,207
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	-	-	-	-	-	-
	(2) ප්‍රාග්ධන	-	-	-	-	-	-
	උප එකතුව	-	-	-	-	-	-
	මුළු එකතුව	861,000,000	89,440,000	-	950,440,000	814,461,793	135,978,207

ඩබ්ලිව්.එම්.ඩී. ඒකේඛාර
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී.ඒකේඛාර
දිනය :2025 පෙබරවාරි 21

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදනය, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
		මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
-	-	-	-	-	-
-	-	-	-	-	-
-	-	-	-	-	-
-	-	-	-	-	-

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

Cumulative Non Financial Asset Accounts Report- Central Govt-2024

Land-9153: 1,677,050,000.00 Table: SA 82
Building- 9151: 187,012,552.58 Year: 2024
Machinary-9152: 352,594,970.61 Rpt Date 2/19/2025 3:28:05 PM
WIP-9160: 0.00 Head 010
Intangible-9154: 0.00
Lease-9180: 0.00

Ledger	category	Item	Code	Opn_Bal	Opn_Bal_Add	TransferIn	Purchase	Disposal	Balance
9151	1.2-Non Residential Building		61112	187,012,552.58	0.00	0.00	0.00	0.00	187,012,552.58
		Office Building	****6111201	187,012,552.58	0.00	0.00	0.00	0.00	187,012,552.58
9152	2.1-Transport Equipment		61121	192,821,699.00	0.00	0.00	0.00	0.00	192,821,699.00
		Passenger vehicle	****6112101	189,270,200.00	0.00	0.00	0.00	0.00	189,270,200.00
		Motor cycle	****6112109	3,551,499.00	0.00	0.00	0.00	0.00	3,551,499.00
9152	2.2-Other Machinary & Equipment		61122	129,920,939.05	396,115.75	0.00	29,852,332.56	396,115.75	159,773,271.61
		Office Equipment	****6112201	3,480,474.25	20,771.24	0.00	1,180,398.24	20,771.24	4,660,872.49
		Computer Equipment	****6112202	69,961,216.59	239,779.74	0.00	13,894,610.00	239,779.74	83,855,826.59
		Electrical Equipment	****6112203	19,082,680.93	19,300.00	0.00	8,934,721.09	19,300.00	28,017,402.02
		Communication Equipment	****6112204	7,210,400.66	35,500.00	0.00	837,565.00	35,500.00	8,047,965.66
		Furniture	****6112205	29,268,679.21	80,764.77	0.00	5,005,038.23	80,764.77	34,273,717.44
		Medical Equipment	****6112207	74,800.00	0.00	0.00	0.00	0.00	74,800.00
		Construction Eqipment	****6112213	824,287.41	0.00	0.00	0.00	0.00	824,287.41
		Defence Equipment	****6112215	18,400.00	0.00	0.00	0.00	0.00	18,400.00
9153	4.1-Land		61410	1,677,050,000.00	0.00	0.00	0.00	0.00	1,677,050,000.0
		Land	****614100	1,677,050,000.00	0.00	0.00	0.00	0.00	1,677,050,000.0

REMARKS
This is a computer-generated document. No signature is required.
-

Report Generated by the new CIGAS Web Application--Developed by S.Tharshan - Director, Dept of State Accounts

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PIC/C/CIABOC/2/24/01

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2025 මැයි 30 දින

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව

ශීර්ෂය - 010 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය - 010 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 155 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණනය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම්

හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

යුරෝපා සංගමයේ ප්‍රදාන යටතේ මූල්‍යනය කරනු ලබන ශ්‍රී ලංකාවේ අධිකරණ අංශයට සහාය වීමේ ව්‍යාපෘතිය (JURE) විසින් 2024 වර්ෂය තුල ප්‍රදානය කර තිබූ වත්කම් අයිතම 19කට අදාල රු.25,394,239ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

2024 අගෝස්තු 04 දින මියගිය නිලධාරියකුට අදාලව අය විය යුතු එකතුව රු.128,576 ක් වූ ණය ශේෂය සහ 2023 අගෝස්තු 02 දින සේවය හැර ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.172,500 ක් වූ ආපදා ණය ශේෂය 2025 මැයි 09 දින වන විටත් අය වී නොතිබුණි.

3.2 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම අල්ලස් වැටලීම්වල - අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 වර්ෂයේ වැටලීම් 104ක් සිදුකර තිබූ අතර ඒ සඳහා රු.67,618,300ක් අත්තිකාරම් ලබා දී තිබුණි. එසේ සිදු කළ වැටලීම් වලින් 50ක් ඉදිරි ක්‍රියාමාර්ග ගත හැකි සිද්ධි වූ අතර ඒ සඳහා රු.54,046,710ක අත්තිකාරම් මුදල් නිකුත් කර තිබුණි. ඉදිරි ක්‍රියාමාර්ග ගත නොහැකි වැටලීම් ගණන 54ක් වූ අතර ඒ වෙනුවෙන් නිකුත් කළ රු.13,586,590ක අත්තිකාරම් මුදල් සරප් වෙත පියවා තිබුණි.

(ආ) අල්ලස් වශයෙන් පරිහරණය සඳහා අත්තිකාරම් මුදල් ලබා දී එම වැටලීම් සාර්ථක වූ විට නීතිමය පියවර ගැනීම සඳහා එකී අත්තිකාරම් මුදල් නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ රඳවාගෙන නඩු තීන්දුව ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සරප් වෙත එම මුදල් නිරවුල් කළ යුතු වුවද නඩු භාණ්ඩ අංශය විසින් 2025 අප්‍රේල් 24 දිනට විගණනය වෙත ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව අවසන් වී ඇති නඩු 40කට අදාල වැටලීම් අත්තිකාරම් එකතුව රු.1,795,985 ක් විවිධ හේතු මත නිදහස් කිරීමට නොහැකිව පැවතුණි.

(ඇ) නඩු තීන්දුව ලැබීමෙන් හෝ අභියාචනා අවසන් වීමෙන් අනතුරුව එම ගොනුවලට අදාළව නඩු භාණ්ඩ නිලධාරියාගේ භාණ්ඩ ශේෂය තුළ පවතින භාණ්ඩ පොත්වලින් ඉවත් කළ යුතු වුවත් නඩු තීන්දුව ලබාදී වර්ෂ ගණනාවක් ගත වී තිබුණද භාණ්ඩ අයිතම 04කට අදාලව භාණ්ඩ 05ක්, නඩු භාණ්ඩ භාර නිලධාරියා භාරයේ 2024 දෙසැම්බර් 31 දින වන විටත් පැවති බව නිරීක්ෂණය විය.

(ඈ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් මු.රෙ.756(6) ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2024 වර්ෂයට අදාළ නඩු භාණ්ඩ හා මුදල් පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත 2025 මැයි 19 දින තෙක් ඉදිරිපත් කර නොතිබුණි.

3.3 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නාත්වීකව පිළියෙල කර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 17ක් සඳහා සලසාගත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.91,594,784 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබූ අතර මෙම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 16 සිට සියයට 100 දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.

(ආ) මූලධන වැය විෂයයන් 04 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.22,737,537 ක ඉතිරිවීම් පැවති අතර එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 19 සිට සියයට 89 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 03ක් සඳහා මූලික ඇස්තමේන්තුව මඟින් ලබාගත් ප්‍රතිපාදනවලින් මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන් සඳහා එකතුව රු.48,686,000 ක් මාරු කර තිබූ අතර එම මාරු කිරීම් අගය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 28 සිට සියයට 63දක්වා පරාසයක පැවතුණි.

(ඈ) ඌන ප්‍රතිපාදන පැවති පුනරාවර්තන වැය විෂයයන් 04 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.46,500,000 ක් මු.රෙ. 66 මඟින් අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබූ අතර එය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 12 සිට සියයට 94 දක්වා පරාසයක පැවතුණි.

3.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94 (2) හා (3) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් බැරකම් පිළිබඳ ප්‍රකාශය තුළ බැඳීම් හා බැරකම් ලෙස රු.10,215,397ක් දක්වා තිබුණද, භාණ්ඩාගාර සමුච්චිත බැඳීම් සහ බැරකම් පිළිබඳ වාර්තාවෙහි (SA 92) බැඳීම් හා බැරකම් ලෙස රු.5,986,785 ක් පමණක් දැක්වීම නිසා රු.4,228,612 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මු.රෙ. 94 (1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිදු වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු බව දක්වා ඇතත් වැය විෂයයන් දෙකක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරිවීම් එකතුව රු.933,878 ක් වුවද එම වැය විෂයයන්ට අදාළව බැරකම් ලෙස එකතුව රු.1,459,078 ක් දක්වා තිබීමෙන් ප්‍රතිපාදන ඉක්මවා රු.525,300 ක් බැරකම්වලට එළඹ තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යයභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **කොමිෂන් සභාව වෙත යොමු වී තිබූ පැමිණිලි**

2024 වර්ෂයේදී ලද පැමිණිලි සංඛ්‍යාව 4,267 ක් වූ අතර වර්ෂය ආරම්භයේ පැවති පැමිණිලි සංඛ්‍යාව 389 ක් සමඟ මුළු පැමිණිලි සංඛ්‍යාව 4,656 ක් විය. ඉන් පැමිණිලි 3,873 ක් පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කර තිබුණි. පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලිවලින් 1,105 ක් විමර්ශනය කිරීමටත්, 1,175 ක් විමර්ශනය නොකිරීමටත් පැමිණිලි 1,593 ක් සඳහා වෙනත් ආයතන වෙත යොමු කිරීම, වෙනත් ආයතනවලින් හා නීති අංශයෙන් වාර්තා කැඳවීමටත් තීරණය කර තිබුණි. ඒ අනුව පැමිණිලි කමිටුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි වලින් විමර්ශනය සඳහා නියෝග ලද පැමිණිලි ප්‍රමාණය සියයට 28ක් විය.

(ආ) **කොමිෂන් සභාව වෙත යොමු වී තිබූ පැමිණිලි පිළිබඳ විමර්ශන ප්‍රගතිය**

2024 වර්ෂය ආරම්භයේ විමර්ශනය සඳහා පැවැති ගොනු සංඛ්‍යාව 2,353ක් ක් වූ අතර 2024 වර්ෂය තුල විමර්ශන කාර්යයන් සඳහා ලැබී තිබූ ගොනු සංඛ්‍යාව 2,941ක් සමඟ එකතුව 5,294ක ගොනු සංඛ්‍යාවක් සමාලෝචිත වර්ෂය තුල විමර්ශන අංශය සතුව පැවතුණි. එයින් ගොනු 2,933ක් 2024 වර්ෂය තුල විමර්ශන කටයුතු සිදු කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට විමර්ශන කාර්යයේ සක්‍රීයව පැවති ගොනු සංඛ්‍යාව 2,361ක් වූ අතර එහි පැමිණිල්ල යොමු වූ වර්ෂය අනුව, වර්ෂයට අඩු ගොනු 715 ක්ද,

වසර 01 සිට 05 දක්වා කාලයට අදාල ගොනු 1283 ක්ද වසර 05 සිට 10 දක්වා කාලයට අදාල ගොනු 347 ක්ද සහ වසර 10 ට වැඩි ගොනු 16 ක්ද විය.

(ඇ) **නීති අංශයේ ප්‍රගතිය**

නීති කාර්යයන් ඉටුකිරීම සඳහා 2024 දෙසැම්බර් 31 දිනට නීති අංශයේ එක් එක් නීති නිලධාරීන් භාරයේ පැවති ගොනු සංඛ්‍යාවේ එකතුව 846ක් විය. නීති අංශයේ ඉටු කරන ලද කාර්යයන් වලට අදාලව පවත්වාගෙන යායුතු සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති ගොනු සංඛ්‍යාව, 2024 වර්ෂය තුළ නීති කාර්යයන් සිදු කිරීම සඳහා ලද ගොනු සංඛ්‍යාව, 2024 වර්ෂය තුල නීති කාර්යයන් සිදු කල ගොනු සංඛ්‍යාව සහ 2024 දෙසැම්බර් 31 දිනට නීති කාර්යයන් ඉටු කිරීමට පැවැති ගොනු සංඛ්‍යාවට අදාලව පැමිණිල්ල යොමු වූ වර්ෂය පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ඈ) **නඩු පැවරීමේ ප්‍රගතිය**

2024 වර්ෂය ආරම්භයේ විභාග වෙමින් පැවති නඩු සංඛ්‍යාව 245 ක් වූ අතර වර්ෂය තුළ නඩු පැවරීම් 83 ක් සමඟ 2024 වර්ෂයට අදාලව පැවති නඩු සංඛ්‍යාවේ එකතුව 328 ක් විය. මෙයින් වර්ෂය තුළ අවසන් වූ නඩු සංඛ්‍යාව 69 ක් විය. එයින් වරදකරු බවට පත්කර ඇති නඩු සංඛ්‍යාව 26 ක් හා නිදොස්කොට නිදහස් කර ඇති හා නිදහස් කර ඇති නඩු සංඛ්‍යාවේ එකතුව 35 ක් විය. 2024 දෙසැම්බර් 31 දිනට විභාග වෙමින් පැවති නඩු සංඛ්‍යාව 259ක් වී තිබුණු අතර එම නඩුවලට අදාළව පැමිණිල්ල යොමු වූ වර්ෂය අනුව වසර 01 ට අඩු නඩු සංඛ්‍යාව 03 ක්ද, වසර 01 සිට 05 දක්වා නඩු සංඛ්‍යාව 100 ක්ද වසර 05 සිට 10 දක්වා නඩු සංඛ්‍යාව 113 ක්ද, වසර 10 ට වැඩි නඩු සංඛ්‍යාව 43 ක්ද විය.

(ඉ) **පැමිණිලි පිලිබඳ කාර්යයන් ඉටුකිරීමට අදාල දත්ත කළමනාකරණ පද්ධතිය**

කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි පිළිබඳව වඩා කාර්යක්ෂම, නිවැරදි හා විනිවිදභාවයකින් යුතුව ක්‍රියා කිරීම සඳහා විධිමත් දත්ත කළමනාකරණ පද්ධතියක් සැකසීම අත්‍යවශ්‍ය කාරණයක් වුවද, 2024 දෙසැම්බර් 31 දින වන විට කොමිෂන් සභාව පිහිටුවා වසර 30ක කාලයක් ගතවී තිබුණද නිසිලෙස ක්‍රියාත්මක දත්ත කළමනාකරණ පද්ධතියක් නොමැති වීම හේතුවෙන් පැමිණිල්ලක් ලද අවස්ථාවේ සිට නඩු පවරන අවස්ථාව දක්වා වූ ක්‍රියාවලියේදී අදාල ලිපිගොනුව පවතින අංශය, පුද්ගලයා හා එහි තත්ත්වය ක්ෂණිකව හා නිශ්චිතව ලබාගැනීමට නොහැකි විය.

(ඊ) **වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම**

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත මගින් වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ සහ සත්‍යාපනය කිරීමේ වගකීම කොමිෂන් සභාව වෙත පැවරී තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් පාලනය කරනු ලබන මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියක් මඟින් මෙම කාර්යයන් සිදු කළ යුතුව ඇත. 2024 දෙසැම්බර් 31 දින තෙක් වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ මාර්ගගත ඉලෙක්ට්‍රොනික දත්ත පද්ධතිය සැකසීමේ කාර්යයන් නිමවී නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) රජයේ වාහන නඩත්තු කිරීම පිළිබඳ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කොමිෂන් සභාව සතු වාහන 26ක කිසිදු දිනෙක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 4.3 ඡේදයට අනුකූල නොවන ලෙස 2024 වර්ෂය තුළ සිදුකරන ලද අභ්‍යන්තර අලුත්වැඩියා අවස්ථා 56 ක ඇස්තමේන්තු මිල ගණන් සඳහා චක්‍රලේඛයේ උපදෙස් පරිදි යන්ත්‍රික ඉංජිනේරු වාර්තා ලබාගෙන නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 1645(අ) පරිදි ලොග් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී BMW රථය පිත්තාරු කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා එක් පෞද්ගලික ආයතනයක් වෙතින් පමණක් වන පරිදි අලුත්වැඩියා මිල ඇස්තමේන්තු ලබාගෙන ඒ සඳහා යාන්ත්‍රික ඉංජිනේරු හෝ තාක්ෂණික කමිටුවක නිර්දේශ ලබාගැනීමෙන් තොරව ප්‍රසම්පාදන කමිටුවක අනුමැතිය මත පමණක් රු.2,983,438 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණි. එසේ වුවද දෛනික සටහන අනුව මෙම රථය 2023 දෙසැම්බර් 29 දින අවසන්වරට ධාවනය කර තිබුණු අතර අලුත්වැඩියාවෙන් පසුවද රථය ධාවන තත්ත්වයේ නොමැති බැවින් අපහරණය කිරීම සඳහා 2025 ජනවාරි 27 දිනැති කමිටුව මඟින් අනුමැතිය ලබාදී තිබුණි. මේ අනුව මෙම රථය අලුත්වැඩියා කලද ධාවන තත්ත්වයට පත් නොවීම නිසා අලුත්වැඩියා වශයෙන් වැය කර තිබූ එකතුව රු.2,983,438 ක මුදල අනාර්ථික වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) කොමිෂන් සභාවේ මූල්‍ය නොවන වත්කම්වලට අදාලව CIGAS පරිගණක පද්ධතිය තුලින් ජනිතවන වත්කම් කේතයන් භෞතික වත්කම්වල යොදා නොතිබීම හේතුවෙන් වත්කම් හඳුනාගැනීම හා අවශ්‍ය අවස්ථාවලදී වත්කම් නිසි ලෙස අපහරණය කිරීමට අපහසුතා මෙන්ම භාණ්ඩ සමීක්ෂණයේදී වත්කම්වල නිවැරදිභාවය තහවුරු කර ගැනීමටද නොහැකි විය.

(ඊ) 2017 ජුනි 26 දිනැති අංක 01/2017 දරන වත්කම් කලමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් පිරිවැය රු.29,852,332ක් වූ වත්කම් සහ අපහරණය කරන ලද පිරිවැය රු.396,115ක් වූ වත්කම් පිලිබඳ වාර්තා කොමිප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර නොතිබුණි.

4.2.1 භාණ්ඩ සමීක්ෂණය

නීති අංශයට හා නීති සහකාර අංශයට අදාළව 2025 මාර්තු 17 දින විගණනය වෙත ඉදිරිපත්කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ පිළිවෙළින් අයිතම 77ක් හා අයිතම 21ක් සඳහා ලේජරය අනුව ශේෂ සඳහන් කර නොතිබීම හේතුවෙන් අසම්පූර්ණ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ සමස්ත පුරප්පාඩු සේවක සංඛ්‍යාව 470 ක් එනම් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 50 ක් විය. මෙම පුරප්පාඩු සංඛ්‍යාව තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 25 ක්, තෘතීය මට්ටමේ පුරප්පාඩු 187 ක්, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 216 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 42 ක් වශයෙන් වූ අතර මෙම තත්ත්වය කොමිෂන් සභාවේ කාර්යයසාධනය කෙරෙහි සෘජුව බලපා හැකි බවද නිරීක්ෂණය විය.

(ආ) උපාධිධාරී විමර්ශන නිලධාරීන් 200 දෙනෙකු බඳවාගැනීම සඳහා වූ විවෘත තරහ විභාගය 2018 ඔක්තොම්බර් මාසයේදී පවත්වා, විමර්ශන නිලධාරීන් බඳවාගැනීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් 2019 වර්ෂය අවසාන වන විට රු.7,392,734 ක් වැයකර තිබුණි. 2020 හා 2022 වර්ෂයන් තුල මෙම නිලධාරීන් බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාදී අයවැය ප්‍රතිපාදන වෙන් කර දී තිබුණද විභාගය පවත්වා වසර 04 කට පසුව එනම් 2023 පෙබරවාරි 27 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණය පරිදි මෙම කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් (සිවිල්) බඳවා ගැනීම නතර කර තිබුණි.

ඒ.ජී.ඒ. හෙල්මිණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ.) වෙනුවට

සිව්වන පරිච්ඡේදය

4. කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4. කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුම	තත්‍ය නිමැවුම	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
				100% - 90%	75% - 89%	50% - 74%
01	පවත්වන ලද පැමිණිලි කමිටු රැස්වීම් සංඛ්‍යාව	53	85	√		
02	අවසන් කල විමර්ශන ගොනු සංඛ්‍යාව	3,000	2,933	√		
03	අධිකරණවල පවරන නඩු සංඛ්‍යාව	75	114	√		
04	පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	140	139	√		
05	පවත්වන ලද කොමිෂන් සභා රැස්වීම් සංඛ්‍යාව	12	12	√		
06	පවත්වන ලද විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව	04	04	√		
07	දරන ලද පුනරාවර්තන වියදම්	826,520,000.00	715,489,872.38		√	
08	දරන ලද ප්‍රාග්ධන වියදම්	123,920,000.00	98,971,920.58		√	

පස්වන පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අරමුණු ප්‍රකාශයේ අංක: 16.5 යටතේ දක්වා ඇති පරිදි ''සෑම අංශයකම අල්ලස හා දූෂණය කැපී පෙනෙන ලෙස අඩු කිරීම'' සඳහා කටයුතු කිරීම.

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0%-49%	50%-74%	75%-100%
රාජ්‍ය සේවයේ සෑම අංශයකම අල්ලස හා දූෂණය කැපී පෙනෙන ලෙස අඩු කිරීම	අල්ලස හා දූෂණ නිවාරණය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය වැඩි කිරීම තුලින් අල්ලසට හා දූෂණයට එරෙහි ප්‍රජා දායකත්වය වැඩි කර ගැනීම • වර්ෂයකට දැනුවත් කිරීමේ වැඩසටහන් 140 ක් පැවැත්වීම	• ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 139 ක් පැවැත්වීම			√
	• නීති නිළධාරීන්,විමර්ශන නිළධාරීන් හා දූෂණ නිවාරණ නිළධාරීන් ඇතුළු සෙසු නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම	• නිළධාරීන් 285 දෙනෙකු සඳහා පුහුණුඅවස්ථා ලබා දීම			
	• අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රු. 123,920,000.00ක් වෙන් කිරීම	• පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රු. 98,971,920.58ක මුදලක් වැය කිරීම			√

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0%-49%	50%-74%	75%-100%
රාජ්‍ය සේවයේසෑම අංශයකම අල්ලස හා දූෂණය කැපී පෙනෙන ලෙස අඩු කිරීම	2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව බලගැන්වීම හා ප්‍රතිව්‍යුහගතකරණය කිරීම	ප්‍රතිව්‍යුහගතකරණ යෝජනාවලිය සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමුකිරීම		√	

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්

<u>ජයග්‍රහණ</u>

- 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත සම්මත කර ගැනීම හා අදාළ විධි විධාන ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දෙමහල් ගොඩනැගිල්ල අළුත් වැඩියා කිරීමේ කටයුතු වලින් 70%ක් පමණ නිමකිරීම.
- දෛනිකව ලැබෙන පැමිණිලි අධ්‍යයනය කර නඩු පැවරීමට ප්‍රමාණවත් කරුණු සහිත පැමිණිලි පමණක් විමර්ශනය සඳහා යොමු කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීම මඟින් විමර්ශන නිළධාරීන්ගේ හා නීති නිළධාරීන්ගේ රාජකාරී කාලය වඩාත් ඵලදායී කර ගැනීමට හැකි වීම
- විමර්ශන කටයුතු කඩිනම් කිරීමට හඳුන්වා දුන් නව ක්‍රමවේදය නිසා 2015 ට පෙර ආරම්භ කළ ගොනු වලින් 90% කට වැඩි ප්‍රමාණයක් විමර්ශන අවසන් කර ගැනීමට හැකි වීම
- දූෂණ නිවාරණ කටයුතු ශක්තිමත් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යටතේ ක්‍රියාත්මක වන JURE ව්‍යාපෘතිය මගින් ආධාර ලබාගෙන අදාළ ක්‍රියාකාරකම් සිදුකිරීමට හැකිවීම.

<u>අභියෝග</u>

- දූෂණ නඩු උසාවියේ ඔප්පු කිරීම සඳහා ලේඛන මත පදනම් වූ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වුවත් එවැනි සාක්ෂි සපයා ගැනීම දුෂ්කර වීම
- අල්ලසට හා දූෂණයට එරෙහි වැඩපිළිවෙලක් රාජ්‍ය අංශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ඇති උනන්දුව අඩු වීම
- දූෂිත නිලධාරීන් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට සහ අවශ්‍ය අවස්ථාවල දී සාක්ෂි ලබා දීමට ජනතාව දක්වන සහයෝගය අවම මට්ටමක පැවතීම
- ඉහළ තනතුරු දරණ පුද්ගලයන්ගේ මහා පරිමාණ අල්ලස් හෝ දූෂණ පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට ව්‍යාපාරිකයින්, ආයෝජකයින් වැනි පාර්ශව ඉදිරිපත් නොවීම
- විවිධ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂඥ දැනුමක් සහිත විශේෂිත විමර්ශන නිලධාරීන් ආයතනය සතු නොවීම.
- අල්ලස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයන්ට ප්‍රමාණවත් කාර්යාල ඉඩ පහසුකම් නොමැතිවීම.

හයවන පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

6.3. මානව සම්පත් සංවර්ධනය

6. මානව සම්පත් පැතිකඩ

කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉටුකිරීමෙහිලා අවශ්‍ය භෞතික හා මානව සම්පත් කළමනාකරණය හා මූල්‍ය කළමනාකරණය පාලන අංශය සහ මුදල් අංශය මගින් සිදුකෙරේ. එම කටයුතු වල ප්‍රගතිය පහත පරිදි වේ.

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	අනුයුක්ත සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	63	42
තෘතීයික	218	07
ද්විතීයික	242	110
ප්‍රාථමික	126	84
එකතුව	649	243
ශ්‍රී ලංකා පොලීසිය විසින් කොමිෂන් සභාවට අනුයුක්තව සේවය කරන විමර්ශන නිළධාරීන්	283	219
මුළු එකතුව	932	462

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත මගින් කොමිෂන් සභාවට කටයුතු කල හැකි රාජකාරී වපසරිය විශාල වශයෙන් පුළුල් කර ඇත. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වැරදි සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂයෙන් පුද්ගලික අංශයේ හා ක්‍රීඩා සම්බන්ධ ආයතන වැනි පුළුල් වූ විෂය පථයන් පවා මෙමගින් ආවරණය කර ඇත. එමෙන්ම වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සම්බන්ධ මධ්‍යම අධිකාරිය බවටද කොමිෂන් සභාව පත්කර ඇත. මෙම සියළු කටයුතු සිදු කිරීම සඳහා දැනට සිටින කාර්ය මණ්ඩලය කිසිසේත්ම ප්‍රමාණවත් නැත.

කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණයට අදාලව යෝජනාවලිය සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට කොමිෂන් සභාව විසින් යොමුකර ඇති අතර අදාල අනුමැතියෙන් පසු පනතේ 26(2) හි විධිවිධාන පරිදි අදාල අනෙකුත් අනුමැතීන්ද ලබාගෙන නව කාර්ය මණ්ඩලය කඩිනමින් බඳවා ගැනීම සිදුකළ යුතුව පවතී.

6.3. මානව සම්පත් සංවර්ධනය

2024 වර්ෂය තුළ පැවැත්වූ දේශීය පුහුණු වැඩසටහන්

අනු අංකය	පුහුණු වැඩ මුළුව	කාලසීමාව	සහභාගි වූ නිලධාරීන්ගේ විස්තර	
			තනතුර	සංඛ්‍යාව
1	2023 මූල්‍ය ප්‍රකාශන (අවසාන ගිණුම්)	2024.01.11	කළමනාකරණ සේවා නිලධාරී	1
2	2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමන පනත පිළිබඳ දැනුවත් කිරීම	2024.01.22-2024.01.23	සහකාර අධ්‍යක්ෂ (නීති)	1
			ස්ථානාධිපති - වත්කම්	1
3	වෝහාරික පරිගණක විද්‍යාව පිළිබඳ එක්දින පුහුණු වැඩමුළුව (අධිකරණ විද්‍යාත්මක සැකකටයුතු ලේඛන පරීක්ෂාව)	2024.02.13	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	3
			තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	1
			විමර්ශන නිලධාරී	12
4	වෝහාරික පරිගණක විද්‍යාව පිළිබඳ එක්දින පුහුණු වැඩමුළුව (පරිගණක අපරාධ හා ඩිජිටල් අපරාධ පරීක්ෂාව)	2024.03.02-202403.04	විමර්ශන නිලධාරී	20
5	Computer Hardware with Network පාඨමාලාව	2024.02.20 මාස 06	තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සහකාර	1
6	පරිගණක අපරාධ විමර්ශන පුහුණු වැඩමුළුව පැවැත්වීම	2024.03.02 , 2024.03.08හා 2024.03.09	විමර්ශන නිලධාරීන්	20
7	Medico Legal Society of Sri Lanka Sexual And Gender based – violence in Sri Lanka	2024.02.16-2024.02.17	සහකාර අධ්‍යක්ෂ ජනරාල්	3
			සහකාර අධ්‍යක්ෂ (නීති)	3
			නීති සහකාර	5
8	නිවාඩු ලිපිකරුවන්ගේ කාර්ය භාරය හා වගකීම්	2024.05.27-2024.05.28	සංවර්ධන නිලධාරී	2
9	ඡායාරූපකරණය සහ වීඩියෝකරණය පිළිබඳ පාඨමාලාව	2024.05.27 සිට දින 10	විමර්ශන අංශ නිලධාරීන්	26
10	ඵලදායිතාවය හැඳින්වීම	2024.06.11	කාර්යාල නිලධාරීන්	33
11	තත්ත්වකව පිළිබඳ හැඳින්වීම	2024.06.18	කාර්යාල නිලධාරී	15
12	ඡායාරූපකරණය සහ වීඩියෝකරණය පිළිබඳ පාඨමාලාව	2024.07.01-2024.07.04	විමර්ශන අංශ නිලධාරීන්	26
13	රජයේ වැටුප් පද්ධතිය පිළිබඳ හඳුන්වා දීම	2024.07.19-2024.07.30	සංවර්ධන නිලධාරී	1

14	ලේඛණ සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුව (අදියර 1)	2024.07.25-2024.07.26	පුස්තකාලයාධිපති	1
15	පරිගණක ජාලකරණය සඳහා වූ පාඨමාලාව	2024.08.03 දින සිට මාස 06ක කාලයක්	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	1
16	ආයතනික කළමනාකරණ වැඩසටහන	2024.08.29	කළමනාකරණ සේවා නිලධාරී	1
17	වැටුප් පරිවර්ථන වැඩසටහන	2024.09.13	කළමනාකරණ සේවා නිලධාරී	1
18	ග්‍රැෆික් නිර්මාණකරණය NVQ - IV	දින 42	දූෂණ නිවාරණ නිළධාරී	1
19	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරට බඳවාගත් නිළධාරීන් සඳහා පැවැත්වෙන වැඩමුළුව	2024 ඔක්තෝබර් 02,04,07,08,09,10,14,15,18,21,23.	සහකාර අධ්‍යක්ෂ (නීති)	16
20	නව නීති නිළධාරීන් සඳහා වන නේවාසික තෙදින වැඩමුළුව	2024.10.11,12,13	සහකාර අධ්‍යක්ෂ (නීති)	16
21	බදු නීතිය සහ ආදායම් බදු වගකීම ගණනය කිරීම පිළිබඳ වගකීම	2024.11.05	කළමනාකරණ සේවා නිලධාරී	1
22	රියැදුරන් පුහුණු කිරීමේ පුහුණු වැඩසටහන	2024.11.23	රියැදුරු නිළධාරී	27
23	කොමිෂන් සභාවේ ප්‍රාථමික හා ද්විතියික මට්ටමේ නිළධාරීන්ගේ ආකල්ප හා හැකියාවන් වර්ධනය	2024.12.28	නීති සහකාර	2
			පුස්ථකාලයාධිපති	1
			අයවැය සහකාර	1
			දූෂණ නිවාරණ නිළධාරී	5
			සංවර්ධන නිළධාරීන්	8
			තොරතුරු තාක්ෂණ සහකාර	2
			කළමනාකරණ සහකාර	21
			යතුරු ලේඛක	4
			ලඝු ලේඛක	1
			කාර්යාල කාර්ය සහායක	23
			රියැදුරු	6
24	රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව		කළමනාකරණ සේවා නිලධාරී	2

2024 වර්ෂය තුළ පැවැත්වූ විදේශීය පුහුණු වැඩසටහන්

අනු අංකය	පැවැත්වූ රට	සම්මන්ත්‍රණය/ වැඩමුළුව	සහභාගී වූ නිලධාරීන්ගේ තොරතුරු		කාල සීමාව	වියදම
			නම	තනතුර		
1	India	Joint Collaboration between the GOSL & NCGG of GoI Sri Lankan Delegation	Mr. W.M.N.P. Iddawala Mrs. R. Wickramasinghe	Chairman DDG	12.02.2024 – 17.02.2024	Insurance Rs. 9,693.13 Incidental Allowance USD 480 Refund Amount USD 40
2	Dubai-UAE	Safeguarding Sport From Competition Manipulation – focus on Investigation and Prosecution	Mrs. S.M.A.A.P.K. Sammandapperuma	ADL	24.04.2024 - 25.04.2024	Insurance Rs. 3,187.01 Incidental Allowance USD 100
3	India	First Mid-Career Training programme for Island Service Officers of Sri Lanka	Mrs. G.N. Jayasinghe	Accountant	13.05.2024 - 24.05.2024	Incidental Allowance USD 325 Warm Clothing Allowance Pound 75
4	Austria -Vienna	UNODC UNACC COSP – Invitation to 13th EMIC, Resumed 15th IRG and 18th WGAR (States Parties)	Mrs. M.R.Y.K. Udawela	Add.DG	11.06.2024 - 14.06.2024	Incidental Allowance USD 160 Combined Allowance USD 1484 Air Tickets Rs. 551,484.00 Insurance Rs. 5,333.46
5	China	Visit of Ningxia	Mr. W.K. Damith Wijerathna	DG	25.06.2024 - 29.06.2024	Incidental Allowance USD 100
6	Austria – Vienna	UNODC UNCAC COSP : First Resumed for Fifteenth Session of the Implementation Review Group – Travel of Least Developed Countries	Mr. W.M.N.P. Iddawala Mrs. D.G.J. Heiyanthuduwa Mrs. G.A.D. Sajeewani	Chairman DDG ADG	From 28.08.2024 to 06.09.2024	Incidental Allowance USD 1200 Combined Allowance USD 13,020 Air Tickets Rs. 1,229,500.00 Insurance Rs. 21,730.72

7	Chinna	Financial Support for Participation Fifth Plenary Meeting of Globe Network	Mr. K.B. Rajapaksha Mrs. D.I. Rajapaksha Ms. W.M.T.D. Bandara Mrs. J.P.T.N. Jayaneththi	Commissioner - II ADG ADG ADL	From 24.09.2024 to 30.09.2024	Incidental Allowance USD 1200
8	Bhutan-Thimpu	ADB-Seminar Government Incentives for Corporate – Anti Corruption Compliance	Mr. Chethiya Goonesekera Mrs. B.W.M.U.M. Kumarihamy	Commissioner - III ADL	From 25.09.2024 to 27.09.2024	Incidental Allowance USD 250 Warm Clothing Allowance Pound 75
9	Japan	Criminal Justice Response to Corruption	Mrs. L.K.T.D. Dayarathne	ADG	From 20.10.2024 to 21.11.2024	Incidental Allowance USD 375 Warm Clothing Allowance Pound 75
10	Moscow	Workshop on the effective implementation of reccommendations emanating from the country reviews in the framework of the mechanism for the review of implementation of the united nations convention against corruption (UNCAC)	Mr. C.A.S.G. Anthony	ADG	From 08.10.2024 to 10.10.2024	Incidental Allowance USD 125 Warm Clothing Allowance Pound 75 Insurance Rs. 3,935.64
11	Austria - Vienna	Second resume fifteenth session of the implementation review group	Mr. Chethiya Goonesekera Mrs. K.H.I.S. Siriwardena	Commissioner – III DDG	From 04.11.2024 to 08.11.2024	Air Tickets Rs. 756,000.00 Incidental Allowance USD 560 Combined Allowance USD 3505.95 Insurance Rs. 10,344.32 Visa Fee Rs. 14,860.00

12	Austria - Vienna	Participation in the joint meeting of Yeman in the second review cycle of the Mechanism for the review of Implementation of the United Nations onvention against Corruption	Mrs. D.I. Rajapaksha	ADG	From 11.11.2024 to 13.11.2024	Incidental Allowance USD 200 Warm Clothing Allowance Pound 75
13	Ethiopia	International Expert meenting on Asset Return and Sustainable Development	Mr. S.M. Sabry	ADL	From 11.12.2024 to 13.12.2024	Incidental Allowance USD 200 For Yellow Fever Vaccination Rs. 12,200.00

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ අනුග්‍රහය මත JURE ව්‍යාපෘතිය යටතේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩසටහන්

අනු අංකය	දිනය	වැඩසටහන	ස්ථානය	වියදම (රු.)
1	2024.01.30	නීති නිලධාරීන් සඳහා වන පුහුණු වැඩමුළුව	Kingsbury Hotel - Colombo	373,991.38
2	2024.04.18, 19 දෙදින	නීති නිලධාරීන් සඳහා පුහුණු වැඩ මුළුව	Pegasus	1,362,700.00
3	2024.04.24	විමර්ශන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුව	Ramada - Alhambra Hotels - Colombo	852,000.00
4	2024.06.08	නීති නිලධාරීන් සඳහා පුහුණු වැඩ මුළුව	Taj Samudra	357,360.68
5	2024.06.17, 18, 19	විමර්ශන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුව	Waskaduwa Beach Resort	1,620,000.00
6	2024.06.24, 25	නීති නිළධාරීන් සඳහා ආචාර ධර්ම පද්ධතිය හඳුන්වාදීමේ වැඩමුළුව	Hotel Janaki	546,000.00

හත්වන පරිච්ඡේදය

7. අනුකූලතා වාර්තා

7. අනුකූලතා වාර්තා

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අභ්‍යන්තරයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-	මෙවැනි ගිණුම් නොමැත	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-	මෙවැනි ගිණුම් නොමැත	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම් (වැටලීම් අත්තිකාරම්)	අනුකූල වේ		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩි නඩි ලේඛන /පුද්ගල පඩි නඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අභ්‍යන්තරයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරූණ ක්‍රියාමාර්ග
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අභ්‍යන්තරයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරාකරණ ක්‍රියාමාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අභ්‍යන්තරයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරාකරණ ක්‍රියාමාර්ග
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	-	එවැනි ගිණුම් නැත	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරවකටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර ගැනීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරූණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමා නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	-		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූලවීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර සිටීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-	එවැනි ගිණුම් නැත	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරූණ ක්‍රියාමාර්ග
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-	එවැනි ගිණුම් නැත	
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	-		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත් කාලීන කර පවත්වා ගෙනයාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ්අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ යෝජනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අභ්‍යන්තරයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරාකරණ ක්‍රියාමාර්ග
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛඅංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා සියළුම නිලධාරීන්ට පැය 12ක පුහුණුව ලබා දීමට නොහැකි වීම	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	-		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		